# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2015

### 2020 පෙබරවාරි - සැප්තැම්බර්

### සමාජීය විද්‍යා පීඨය

### ආර්ථික විද්‍යාව

### මූලධර්ම ආර්ථික විද්‍යාව ECON E - 1015

**කැමති ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි.** **කාලය : පැය 03 යි.**

---

01. (අ) 'සූක්ෂම ආර්ථිකවිද්‍යාව'නිදසුන් සහිතව අර්ථ දක්වන්න.

(ආ) 'යථානුරූපී ආර්ථිකවිද්‍යාව' සහ 'අභිමතානුරූපී ආර්ථිකවිද්‍යාව' අතර පවත්නා වෙනස්කම් යෝග්‍ය නිදසුන් මගින් පැහැදිලි කරන්න.

(ඉ) නිෂ්පාදන හැකිය මායිම් වක්‍රය පදනම් කරගන්නා උපකල්පන මොනවාද ?

(ඊ) සම්පත් බෙදීයාමේ ආර්ථික කාර්යක්ෂමතාව සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය කෙරෙන කොන්දේසි මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05 බැගින්)

02. තරඟකාරී වෙළෙඳපොලක අලෙවි කෙරෙන භාණ්ඩයක් සඳහා වන ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත සඳහන් සමීකරණ මගින් නිරූපනය කෙරේයැයි සලකන්න.

$Q_d = 4000 - 2P_x + 4P_y + 0.5Y$ සහ $Q_s = -400 + 3P_x$

$P_y = 30$ සහ $Y = 6000$

(I) මෙම භාණ්ඩයේ සමතුලිත මිල හා ප්‍රමාණය සොයන්න.

(II) වෙළෙඳපොල සමතුලිතයේදී මිල ඉල්ලුම් නම්‍යතාව ගණනය කරන්න.

(III) මෙම භාණ්ඩයේ නිෂ්පාදකයින් වෙත ඒකකයකට රුපියල් 10 බැගින් සහනාධාරයක් ලබාදීමට රජය තීරණය කර ඇතැයි සිතන්න. සහනාධාරය ලබාදුන් පසුව මෙම භාණ්ඩයේ වෙළෙඳපොල සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න.

(IV) සහනාධාරයට පෙර හා පසු ආර්ථික අතිරික්තය සංසන්දනය කරන්න.

(ලකුණු 05 බැගින්)

03. (I) සැපයුම වෙනස් වීමට බලපාන සාධක මොනවාද ? පහදන්න.

(II) සැපයුමේ මිල නම්‍යතාව කෙරෙහි බලපාන සාධක සැකෙවින් විස්තර කරන්න.

(III) නිෂ්පාදන ක්‍රියාවලියේදී ආයතනයක කෙටි කාලය දිගු කාලයෙන් වෙනස් වන්නේ කවරක් නිසාද ?

(IV) ප්‍රත්‍යක්ෂ (ඍජු) පිරිවැය සහ ආරෝපිත පිරිවැය අතර වෙනස දක්වන්න.

(ලකුණු 05 බැගින්)

04. (I) හීනවන ආන්තික ඵල සහ අඩුවන පරිමාණානුකූල ඵල අර්ථ දක්වන්න. (ලකුණු 06)

(II) කිසියම් කර්මාන්තයක වෙළෙඳපොල ව්‍යුහය තීරණය කිරීමේදී සැළකිල්ලට ගනු ලබන සාධක කවරේද ? (ලකුණු 06)

(III) 'අර්ධ පොදු භාණ්ඩ' සහ 'සුබසාධන භාණ්ඩ'වල කැපී පෙනෙන ලක්ෂණ උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08)

05. (I) පූර්ණ තරඟකාරී නිෂ්පාදන ආයතනයක් මුහුණ දෙනුයේ කවර ස්වරූපයක ඉල්ලුම් වක්‍රයකටද ? හේතු පහදන්න. (ලකුණු 08)

(II) ඒකාධිකාරී වෙළෙඳපොල මාදිළිය ආර්ථික අකාර්යක්ෂමතාවකට හේතුවන බවට ආර්ථික විද්‍යාඥයින් තර්ක කරනුයේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 12)

06. (I) ඒකාධිකාරී සහ කතිපයාධිකාරී වෙළෙඳපොල මාදිළි අතර පවත්නා සමානතා සහ අසමානතා මොනවාද ? (ලකුණු 10)

(II) ඒකාධිකාරී තරඟ වෙළෙඳපොල මාදිළිය පූර්ණ තරඟය සහ ඒකාධිකාරී වෙළෙඳපොල මාදිළි වලින් වෙනස් වන්නේ කෙසේද ? (ලකුණු 10)

07. (I) අර්ථක්‍රමයක සාර්ව ආර්ථික අරමුණු මොනවාද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 10)

(II) 'පොළී අනුපාතය'සහ උද්ධමනය'අතර පවත්නා සම්බන්ධතාව විස්තර කරන්න. (ලකුණු 10)

08. (I) 'ආර්ථික අවබෝධය හා විශ්ලේෂණය සඳහා ජාතික ගිණුම් දත්ත ඉතා ප්‍රබල උපකරණයක් වේ.' පැහැදිලි කරන්න. (ලකුණු 10)

(II) විවෘත ආර්ථිකයක 'ජාතික ආදායම් චක්‍රීය ප්‍රවාහය' අර්ථ දක්වා එය ජාතික ආදායම ගණනය කිරීමට සම්බන්ධවන්නේ කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 10)

09. පහත සඳහන් හතරක් (4) නිර්වචනය කරන්න.

(I) වැය කළහැකි ජාතික ආදයම

(II) ආන්තික පරිභෝජන නැම්යාව

(III) ප්‍රාග්ධන සම්පාදනය

(IV) තුලන අයවැය ගුණකය

(V) නිෂ්පාදන හැකියා මායිම්

(VI) ගතික විශ්ලේෂණය

(ලකුණු 05 බැගින්)

********************************